# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,545 — 1958 ඔක්තෝබර් 3 වැනි සිකුරාද — 3.10.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## III වැනි කොටස – ඉඩම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)

| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :— | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 1417 |
| ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ දැන්වීම් ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම පිළිබඳ විවිධ දැන්වීම් ... ... | — |
| ඉඩම හිමි ගැමී ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : ජේ 57/58 ඇල්ජී 359 ; ආර්/කනු 215.

### 1954 ‍රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ දෙහිවල-ගල්කිස්ස පළාත් ආණ්ඩු සභා සීමාව තුළ ගල්කිස්සේ පිහිටි පීරිස් පාරේ වරිපනම් අංක 26/8) බණ්ඩගේ වත්ත නම් ඉඩමෙන් අ. 0, රූ. 0, පර්. 5·22 ක් විශාල කැබැල්ලට මායිම ;—

උතුරට : ඩී. මිලිනා ගෝමස් අයිතිකම් කියන පීරිස් පාරේ වරිපනම් අංක 26/5, 6 දරණ දේපළ ;
නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කැබැල්ල ;
දකුණට : ඊ. ඩී. පෙරේරා සහ බී. එච්. ගෝමස් අයිතිකම් කියන පීරිස් පාරේ වරිපනම් අංක 26/9 සහ 34/3 දරණ දේපළ ;
බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කැබැල්ල.

1958 ක්වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

1417—ජේ. ඇන්. බී 7269—931 (9/58)

අංකය : ජේ 57/58 පී 138 ; ආර්/කනු 204.

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කළ පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ දෙහිවල–ගල්කිස්ස පළාත් ආණ්ඩු සභා සීමාව තුළ නැගෙනහිර කලුබෝවිල පිහිටි අක්කර එකක් පමණ විශාල වෙල ගොඩවත්ත නම් ඉඩමට මායිම් :—

උතුරට : හයි ලෙවල් පාර ;
නැගෙනහිරට සහ දකුණට : නාලන්දරාම පාර ;
බස්නාහිරට : කැල්ටෙක්ස් පැට්‍රල් ගබඩාව සහ ස්ටැන්ලි පීරිස් මහතා සහ සී. ඩබ්ලිව්. වනසිංහ මහත්මිය අයිතිකම් කියන ඉඩම්.

1958 ක්වූ සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යිටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :—

කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලයේ තලාහේනේ පිහිටි අළුබෝගහවත්ත යන ඉඩමෙන් අක්කර 1$\frac{1}{4}$ක පමණ විශාලකම් ඇති ප්‍රමාණය. ඊට මායිම්:—

උතුරට : සී/තලාහේන රජයේ සිංහල මිශ්‍ර පාසැල් ඉඩම ;
නැගෙනහිරට : තලාහේන–හල්බොරාව ගම්සභා පාර ;
දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස ;
බස්නාහිරට : මුල්ලේරියාව–තලාහේන ගම්සභා පාර.

අංකය : කිව් බී. 289/ජේ. 57 ඊ 422.

1958ක්වූ සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා,

---

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරනලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරළයේ ආදයම් පාලක නිලධාරිතැනගේ කොට්ඨාශයේ කුරුවාමුල්ල යන ගමේ පිහිටි ඇවරිහේන. යන ඉඩමේන් අක්කරයක පමණ විශාලකම් ඇති කොටසක ප්‍රමාණය:—

උතුරට : සී/කුරුවාමුල්ල රජයේ සිංහල මිශ්‍ර පාසැල් ඉඩම සහ අඹගහවත්ත යන ඉඩම ;
නැගෙනහිරට : සී/කුරුවාමුල්ල රජයේ සිංහල මිශ්‍ර පාසැල් ඉඩම;
දකුණට : සිබල් ද අල්විස් මහත්මයා අයිතිකම් කියන එම ඉඩමේම කොටසක් ;
බස්නාහිරට : මිල්ලගහවත්ත යන ඉඩම.

අංක : කිව්. ඒ 356/ජේ 57ඊ 174.

1958ක්වූ සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා·

---

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමෙ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි:

කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ හෝකන්දර උතුරේ පිහිටි මිල්ලගහවත්ත යන ඉඩමෙන් අක්කර කාලක ($\frac{1}{4}$) පමණ විශාලකම් ඇති කොටසක ප්‍රමාණය. ඊට මායිම්;—

උතුරට : කහන්තොට පාරට වැටෙන මූකලාන පාර ;
නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ;
දකුණට ; පී. ඩබ්ලිව්. ඩී. පාර, ;
බස්නාහිරට : ගනේවත්ත විහාරයට අයිති ධර්ම විද්‍යාලය ඉඩම.

අංක : කිව්.බී. 284/ජේ. 57 පී. 344.

1958ක්වූ සැප්තැම්බර් මස 8 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා,

අංකය : ඇල්එච්/ඒ. 939.

## 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්යොදුන් කෝරලයේ වදුරබ්බ නමැති ගමේ පිහිටි මගුරුවල නමැති අක්කර 2ක් පමණ ඇති ඉඩමට මායිම් :—

උතුරට : දෙන් හෙන්ද්‍රික් කන්නන්ගර මහතාගෙන් පැවතෙන අයට අයත් මෙම ඉඩමේම කොටසක් ;
නැගෙනහිරට : වේයන්ගල්ලේ යූ. ඇල්. ඇම්. සාතුස් මහත්මයාට අයත් මෙම ඉඩමේම කොටසක් ;
දකුණට : ඇන්. වී. ජේම්ස් සිංඤෝ හා ඇන්. වී. විජේසිංහ මහතුන්ට අයත් ගොඩැලඩදෙනිය නමැති ඉඩම ;
බටහිරට : ඒ. සාරානන්ද තෙරුන්වහන්සේට අයත් ශ්‍රී වර්ධනාරාමය, හා ආර්. වී. ජාලිස් අප්පුහාමිට හා ආර්. අබේරත්න හෝනා මහත්මියට අයත් මෙම ඉඩමේම කොටසක්.

අංකය : ජේ. 57/58 ඊ 21/ඇල්එච්/ඒ. 939.

1958 ක්වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

ඇල්එච්/ඒ. 796.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලයේ ආදයම් පාළක නිළධාරි කොටසේ වැලිකල ගමේ පිහිටි ගල්වෙට්යාවත්ත නොහොත් ගල්ඇටවත්ත නමැති අඩි 80 අඩි 60 ප්‍රමාණය ඇති ඉඩමට මායිම් :—

උතුරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ;
නැගෙනහිරට : දෙඩන්ගොඩගේ කරෝලිස් සිංඤෝ හා තවත් අයට අයත් මහවත්ත නමැති ඉඩම ;
දකුණට : පුංචිහෙට්ටිගේ දෙන් රුවිනන් අප්පුහාමි හා තවත් අයට අයත් උස්වත්ත නොහොත් නැදුන්වත්ත නමැති ඉඩම ;
බටහිරට : ලබුගම-පොකුණුවිට ගම්සභා පාර.

අංකය : ජේ.57 ඒඇ‍ෆ් 312/ඇල්එච්/ඒ796.

1958 ක්වූ සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩ විල්ලි හත්පත්තුවේ, තලතුව පළාතේ වැල්ලව නම් ගමෙහි පිහිටි වැල්ලවත්ත නමින් හැඳින්වෙන අ.0, රූ.0, ප.6·3ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් කැබැල්ල :—

උතුරට, නැගෙනහිරට, සහ දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස් ;
බස්නාහිරට : රජයේ ඉඩමෙන් (අංක 2,354 දරණ සැලැස්මේ කට්ටි නො. ඇල් 1,163).

අංකය : 3/63/3/57/73 / ජේ. 57 ඊ. 454

1958ක්වූ අගෝස්තු මස 8 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

යොමු අංකය : ඇල්ඒ. 3599.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරනු ලැබූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතින් සංශෝධනය කරනු ලැබූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

පහත සඳහන් මායිම් තුළ පිහිටා ඇති, හලාවත දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරළේ ප්‍රාදේශික ආදයම නිලධාරි තැනගේ කොට්ඨාශයේ, වීරහේන ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශයට අයත් වීරහේන ගමේ පිහිටි මාදන්ගහවත්ත නමැති ඉඩමෙන් අක්කර $3\frac{1}{4}$ ක වපසරියකින් යුත් ඉඩම් කොටසක්:

උතුරට : එම ඉඩමේ කොටසක් ;
නැගෙනහිරට ; පියසේන මහතා විසින් හිමිකම පාන ඉඩම ;
දකුණට : නාත්තන්ඩිය–මාරාවිල පාර;
බස්නාහිරට : විජේසිංහ මහතා විසින් හිමිකම් පාන ඉඩම ;

යොමු අංකය : ජේ 57/58 ඊ 491.

1958 ක්වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත්, එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

(1) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළාගම් පළාත කරවන ආදයම් පාලක නිලධාරි කොට්ඨාශයට අයත් කැලෑගම් තුලාන ගම්පති වසමේ පිහිටි පහළ කලන්කුට්ටිය නමැති ගමේ පිහිටි, කලංකුට්ටිවැවලක්කර්දු ඉඩමයැයි කියනු ලබන (ඇf්ජ්.වී.පී. 970 ලොට් 44 දරණ කොටසින් පෙන්නුම් කරන) අක්කර 0, රූඩ 0, පර්චස් 30·72 පමණ වූ ඉඩමට මායිම් මෙසේය :

උතුරට සහ නැගෙණහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ;
නැගෙණහිරට සහ දකුණට : රාජසන්තක ලඳු කැලය, (ඇf්ජ්.වී.පී.970 ලොට් 47 සහ 48).

(2) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළාගම් පළාතේ ආදයම් පාලක නිලධාරි කොට්ඨාශයට අයත් කැලෑගම් තුලාන ගම්පති වසමේ පිහිටි පහළකලන් කුට්ටිය ගමේ පිහිටා ඇති (ඇජ්.වී.පී. 970 ලොට් 20) කෝන්ගස්යාය ඉහළ කොටය යැයි කියනු ලබන අක්කර 0, රූඩ 1, පර්චස් 11කින් පමණ යුත් ඉඩමට මායිම් මෙසේය :

උතුරට, බස්නාහිරට සහ දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස් ;
නැගෙනහිරට : රාජසන්තක ලඳු කැලය (ඇf්ජ්. වී. පී. 970 ලොට් 16).

(3) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළාගම් පළාතේ ආදයම් පාලක නිළධාරි කොට්ඨාශයට අයත් කැලෑගම් තුලාන ගම්සති වසමේ පහළකලන්කුට්ටිය ගමේ පිහිටි, (ඇf්ජ්.වී.පී. 970 ලොට් 19, 20 සහ 23) කොන්ගස්යාය ඉහළකොටස යැයි කියනු ලබන අක්කර 0, රූඩ 0, (පර්චස් 38 කින්) පමණ යුත් වූ ඉඩමට මායිම් මෙසේය :

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස, ලොට් 19 සහ 20 ඇf්ජ්. වී. පී. 970 කේ. කිරිමැණිකා සහ අනෙක් අය විසින් හිමිකම් කියන කොටස් ;
නැගෙනහිරට : ලොට් 20 ඇf්ජ්. වී. පී. 970 ;
දකුණට : ලොට් 23 ඇf්ජ්. වී. පී. 970 ;
බස්නාහිරට : ඇජ්.වී.පී. 970 ලොට් 27.

(4) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළාගම් පළාතේ ආදයම් පාලක නිලධාරි කොට්ඨාශයට අයත් කැලෑගම් තුලාන ගම්පති වසමේ, පහළකලන්කුට්ටිය ගමේ පිහිටි (ඇජ්.වී.පී. 970 ලොට් 27) කෝන්ගස්යාය ඉහළ කොටස යැයි කියනු ලබන අක්කර 0, රූඩ 0, පර්චස් 33 කින් පමණ යුත් වූ ඉඩමට මායිම් මෙසේය :

උතුරට සහ දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස් ;
නැගෙණහිරට ; ඇජ්.වී.පී. 970 ලොට් 27 කොටයක් ;
බස්නාහිරට : ඇf්ජ්.වී.පී. 970 ලොට් 29 කොටසක්.

(5) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළාගම් පළාතේ ආදයම් පාළක නිළධාරි කොට්ඨාශයට අයත් කැලෑගම් තුලාන ගම්පති වසමේ සහළකලන්කුට්ටිය යන ගමේ පිහිටි (ඇජ්.වී.පී.970 ලොට් 27) කෝන්ගස්යාය ඉහළ කොටස යැයි කියනු ලබන අක්කර 0, රූඩ 0, පර්චස් 30 කින් පමණ යුත් ඉඩමට මායිම් මෙසේය :

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස්.

(6) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළාගම් පළාතේ ආදයම් පාළක නිළධාරි කොට්ඨාශයට අයත් කැලෑගම් තුලාන ගම්පති වසමේ පහළකලන්කුට්ටිය යන ගමේ පිහිටි (ඇජ්.වී.පී. 970 ලොට් 27 සහ 23) කෝන්ගහයාය ඉහළ කොටස යැයි කියනු ලබන අක්කර 0, රූඩ 0, පර්චස් 20 කින් පමණ යුත්වූ ඉඩමට මායිම් මෙසේය :

උතුරට සහ නැගෙණහිරට : ලොට් 27 ඇජ්.වී.පී. 970 ;
දකුණට : ඇජ්.වී.පී. 970 ලොට් 23 ;
බස්නාහිරට : ඇජ්.වී.පී. 970 ලොට් 31.

(7) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළාගම් පළාතේ ආදයම් පාළක නිළධාරි කොට්ඨාශයට අයත් කැලෑගම් තුලාන ගම්පති වසමේ පහළකලන්කුට්ටිය යන ගමේ පිහිටි (ඇජ්.වී.පී. 970 ලොට් 31) කෝන්ගහයාය ඉහළ කොටස යැයි කියනු ලබන අක්කර 0, රූඩ 0, පර්චස් 10 කින් පමණ යුක්ත වූ ඉඩමට මායිම් මෙසේය :

උතුරට සහ දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස් ;
නැගෙණහිරට : ඇජ්.වී.පී. 970 ලොට් 27 ;
බස්නාහිරට : ඇජ්.වී.පී 970 ලොට් 32 ඒ.

(8) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළාගම් පළාතේ ආදයම් පාළක නිළධාරි කොට්ඨාශයට අයත් කැලෑගම් තුලාන ගම්පති වසමේ පහළකලන්කුට්ටිය යන ගමේ පිහිටි (ඇජ්.වී.පී. 970 ලොට් 23) කෝන්ගහයාය ඇලපාත යැයි කියනු ලබන අක්කර 4, රූඩ 1, පර්චස් 24 කින් පමණ යුත් ඉඩමට මායිම් මෙසේය :

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස ;
නැගෙණහිරට : ඇජ්.වී.පී. 970 ලොට් 16;
දකුණට : ඇජ්.වී.පී. 970 ලොට් 40 ;
බස්නාහිරට : ඇජ්.වී.පී. 970 ලොට් 32 බී.

(9) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළාගම් පළාතේ ආදයම් පාළක නිළධාරි කොට්ඨාශයට අයත් කැලෑගම් තුලාන ගම්පති වසමේ පහළකලන්කුට්ටිය යන ගමේ පිහිටි (ඇජ්.වී.පී.970 ලොට් 37) පලුගහයාය යැයි කියනු ලබන අක්කර 0, රූඩ 1, පර්චස් 31කින් පමණ යුක්ත වූ ඉඩමට මායිම් මෙසේය :

උතුරට, නැගෙණහිරට, දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස්.

සී. පී ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ගරු ඇමතිතුමා.

අංකය : ජේ. 57 ඇල්.449,

1958.8.26 වෙනි දින,
කොළඹදීය.

---

අංකය : ඇල්.ඒ. 3.

## 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1)වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

බදුලු දිස්ත්‍රික්කයේ වැල්ලවාය ආදයම් පාළක නිලධාරි කොට්ඨාශයේ කන්ද පල්ල කෝරළයෙහි කොස්ලන්ද ගම්මුලාදෑනි කොට්ඨාශයේ, කොස්ලන්ද වසමට අයත්, 327තේ අන්තිම ගම් සිතියමේ අතිරේක අංක 3හේ අවසාන මැණීමෙන් දක්වෙන කැබලි අංක 35 වන කොස්ලන්ද වසමේ අඹපිටිතැන්නේ කොටසක පිහිටා ඇති අක්කර 0යි, රූඩ 0යි, පර්. 21.0ක් බිම් ප්‍රමාණයක් ඇති සිහරවත්ත.

ජේ.56 ඊ71.

1958ක්වූ අගෝස්තු මස 13 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

ඇල්ඒ 269.

## 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

බදුළු දිස්ත්‍රික්කයේ වියළුව ආදයම් පාළක නිලධාරි කොට්ඨාශයට අයත් නාගොල්ල ගම්මුලාදැනි කොට්ඨාශයේ තල්දෙන ගම කුළ පිහිටි 178 වෙ අන්තිම ගම් සිතියමෙන් දක්වෙන ඕ14, ඇම්14, සහ සී 14න් කොටසක් යන කැබලි වලින් ඒකාබඩවූ කුරුඳුගහගාවයාය නැමැති ඉඩමෙන් අක්කර 6යි, රූඩ 0යි, පා. 13ක පමණ බිම් ප්‍රමාණයකට මායිම් පහත පළවේ :—

උතුරට : 178 වෙ අන්තිම ගම් සිතියමේ කේ14 සහ සී14 යන කැබලි වලින් ඉතිරි කොටස් ;
නැගෙනහිරට : 178වේ ගම් සිතියමේ දක්වෙන වී14 සහ පී14 යන කැබලිද ;
දකුණට : තල්දෙන බෞඩ මිශ්‍ර පාසැල් භූමිය—රජයේ ඉඩම, 178 වෙ අන්තිම ගම් සිතියමේ සී14 කැබැල්ලෙන් ඉතිරි කොටසද සහ හෝම්පලවල්ගොඩ කඳුරද ;
බස්නාහිරට : 178 වෙ අන්තිම ගම් සිතියමේ සී14රේ කැබැල්ලෙන් ඉතිරි කොටස ද වෙත්.

ජේ57/58ඊ419.

1958ක්වූ අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

අංකය : ඇල් ඇල් ඒ 6031.

## 1954 අංක 39 දරණ සංශොධිත ඉඩම් ආඥාපනත අනුව සංශොධනය කරන ලද 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ සංශොධිත ඉඩම් ආඥාපනත අනුව සංශොධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

(1) රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ මුද්දුව ගමේ අංක 80 දරණ අවසාන ගම් සිතියමේ ලොට් 36 දරන බිම් කැබැල්ලේ කොටසක් වන අ. 0, රූ. 0, පර්. 5ක ප්‍රමාණයක් ඇති අඩි පාරේ කොටසක් වන පහත සඳහන් මායිම් තුළ පිහිටි මුඩු බිම් කැබැල්ල :—

උතුරට : ගම්යහා පාර ;
නැගෙනහිරට : අංක 80 දරණ අවසාන ගම් සිතියමේ ලොට් 36 කොටස් ;
දකුණට : අඩිපාර (රජය ලබාගැනීමට අදහස් කරන) ;
බස්නාහිරට : අංක 80 දරණ අවසාන ගම් සිතියමේ ලොට් 36 කොටස සහ පහලම්පිටිය ඉඩමේ කොටස (රජය ලබාගැනීමට අදහස් කරන).

(2) රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරලේ මුද්දුව ගමේ අංක 80 දරණ අවසාන ගම් සිතියමේ ලොට 36 පහලම්පිටිය ඉඩමෙන් අ. 0, රූ. 0, පර්. 2·6 ක ප්‍රමාණයක. මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : අඩිපාර (රජය ලබාගැනීමට අදහස් කරන) ;
දකුණට : මැදම්පිටිය ඉඩම ;
බස්නාහිරට ; එම ඉඩමේ ඉතිරි කොටස.

(3) රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරලේ මුද්දුව ගමේ අංක 80 දරණ ගම් සිතියමේ ලොට් 36 මැදම්පිටිය ඉඩමෙන් අ. 0, රූ. 0, පර්. 7 ක ප්‍රමාණයක පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම :—

උතුරට : පහලම්පිටිය ඉඩමෙන් කොටසක් (රජය ලබාගැනීමට අදහස් කරන) ;
නැගෙනහිරට : අඩි පාර (රජය ලබා ගැනීමට අදහස් කරන) ;
දකුණට : අඩිපාර (රජය ලබා ගැනීමට අදහස් කරන) ;
බස්නාහිරට : එම ඉඩමේ ඉතුරු කොටස.

(4) රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරලේ මුද්දුව ගමේ අංක 80 දරණ අවසාන ගම් සිතියමේ ලොට් 36 ඉහලම්පිටිය ඉඩමෙන් අ. 0, රූ. 0, ප. 2ක ප්‍රමාණයක පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම :—

උතුරට, නැගෙනහිරට සහ දකුණට : අඩිපාර (රජය විසින් ලබාගැනීමට අදහස් කරන) ;
බස්නාහිරට : එම ඉඩමේ ඉතුරු කොටස.

(5) රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරලේ මුද්දුව ගමේ අංක 80 දරණ අවසාන ගම් සිතියමේ ලොට් 36 ඉහලම්පිටිය ඉඩමෙන් අ. 0, රූ. 0, පර්. 5·7 ක ප්‍රමාණයක. මායිම් :—

උතුරට, දකුණට සහ බස්නාහිරට : අඩිපාර (රජය විසින් ලබා ගැනීමට අදහස් කරන) ;
නැගෙනහිරට : එම ඉඩමේ ඉතුරු කොටය.

(6) රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරලේ මුද්දුව ගමේ අංක 80 දරණ අ. ග. සිතියමේ ලොට් 36 දරන බිම් කැබැල්ලේ කොටසක් වන අ. 0, රූ. 0, පර්. 13·2 ප්‍රමාණයක් ඇති අඩිපාරේ මුඩු බිම් කැබැල්ල :—

උතුරට : අඩිපාර (රජය විසින් ලබා ගැනීමට අදහස් කරන) ;
නැගෙනහිරට : අංක 80 දරන අ. ග. සිතියමේ ලොට් 36 සහ අඩිපාර (රජය ලබා ගැනීමට අදහස් කරන) .;
දකුණට : අංක 80 දරන අවසාන ගම් සිතියමේ ලොට් 36 කොටස ;
බස්නාහිරට : මැදම්පිටිය, ඉහලම්පිටිය ඉඩම් (රජය ලබා ගැනීමට අදහස් කර තිබෙන) ;

(7) රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරලේ මුද්දුව ගමේ අංක 80 දරන අ. ග. සිතියමේ ලොට් 36 දරණ බිම් කැබැල්ලේ අ. 0, රූ. 0, පර්. 1·2 ක ප්‍රමාණයක් ඇති අඩිපාරේ කොටස, මුඩු බිම් කැබැල්ල :—

උතුරට සහ නැගෙනහිරට : අංක 80 දරණ අ. ග. සිතියමේ ලොට් 36 ;
බස්නාහිරට : අඩිපාර (රජය විසින් ලබාගැනීමට අදහස් කරන).

1958 ක්වූ අගෝස්තු මස 8 වැනි දින,
රත්නපුර දිස්ත්‍රික්කය.

සී. පී. ද සිල්වා.
ඉඩම් හා ඉඩම් පිළිබඳ ඇමති තුමා.

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබා ගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතෙන් සංශෝධනය කරන ලද 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:—

කැගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ සහ පහත බුලත්ගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොටසට අයත් කිතුල්ගල වසමේ කිතුල්ගල ගමේ පිහිටා තිබෙන ගෝනනවලගාවා වත්ත නැමැති ඉඩමෙන් අක්කරයක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටස. ඊට මායිම් :—

උතුරට : ගිනිගත්හේන–යටියන්තොට මහ/පාර ;
නැගෙනහිරට : අංක 62/14 දරණ බෝක්කුව අසල පිහිටි වියළි දෙල පාර ;
දකුණට : කැළණි ගඟ ;
බස්නාහිරට : අංක 62/13 දරණ බෝක්කුව අසල පිහිටි වියළි දෙළ පාර ගෙය අත්හැර.

අංකය : ජේ 57/58 ටී 89/එල්.එම්. 5706.

1958 ක්වූ සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : ජේ 57 ටී 457/එල්. එම්. 5693.

**ශුද්ධකිරීම**

1954 රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතෙන් සංශෝධනය කරන ලද 1950 හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වෙනි වගන්තිය යටතේ අංක 11,259 සහ 14.2.58 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකර තිබෙන ගරු ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමති තුමාගේ ප්‍රකාශයෙහි 10 වෙනි පෙළේ සඳහන් '' බමුනු කොටුව '' යන වචනය ඉවත් කොට ඒ වෙනුවට '' පමුනු කොටුව '' යන වචනය යෙදිය යුතුයි.

---

අංක. ඇල්ඩී. 4982.

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

7 වෙනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදයම් කොට්ඨාශයේ ගලසිය පත්තුවේ ඌරාවල ගමෙහි පිහිටි හතුවන්ගොඩ වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, ප. 12·5ක්වූ මූලික සිතියම් අංක ඒ 2,531කේ කැබලි අංක 1 සහ 2 යනුවෙන් මැන විස්තර කරන ලද දනට හරන්කහවේ ගල්ලැල්ලේ ඌරාවල පදිංචි ඩබ්ලිව්. ඇම්. ඩිංගිරි බන්ඩා, කේ. ගුණරත්න බන්ඩා, සී. උක්කුබන්ඩා ගල්ලැල්ල, ඩබ්ලිව්. ඇම්. ඩිංගිරිඅම්මා, ඩබ්ලිව්. ඇම්. ඩිංගිරිබන්ඩා සහ ඩබ්ලිව්. ඇම්. බන්ඩාරමැණිකාගේ උරුමක්කාරයින්, විසින් අයිතිවාසිකම් කියනු ලබන කොටස.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 වෙ නොවැම්බර් මස 4 වෙනි දින පෙරවරු 10 ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 වෙ ඔක්තෝබර් මස 29 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද ඒ ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධව ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මෙ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

වර්ෂ 1958ක්වූ සැප්තැම්බර් මස 25 දින,
මහනුවර කච්චේරියේදීය.

ඒ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

---

අංක : ඇල්. ඩී. 4893.

**1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමෙ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ කුම්පනේ ප්‍රාදේශීය ආදයම් කොට්ඨාශයේ පල්ලේ පළාත කෝරලේ කනක්කරපොල ගමෙහි පිහිටි මකුනේවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 08·8 ක් වූ, අවසාන ග්‍රාම සිතියම් අංක 208 වේ දෙවෙනි අතිරේකයේ කැබලි අංක 239 යනුවේන් මැන විස්තර කරන ලද දනට හතරලියද්දේ කනක්කරපොල ඩී. ඇම්. මුදියන්සේ විසින් අයිතිවාසිකම් කියනු ලබන ඉඩම කොටය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 වෙ නොවැම්බර් මස 4 වෙනි දින පෙරවරු 11 ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1958 ඔක්තෝබර් මස 29 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තවද ඒ ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධව ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මෙ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

වර්ෂ 1958ක්වූ සැප්තැම්බර් මස 25 දින,
මහනුවර කච්චේරියේදීය.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

යොමු අංකය : ඇල්.ඒ. 3614.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

අංක : ඒ.1,534 දරණ මූලික සැලැස්ම  ගම : බස්නාහිර කිරිමැටියාන

| කට්ටි අංක | ඉඩමෙ නම | විස්තර | හිමිකම්පාන්නාගේ නම | වපසරිය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | දබරේරාවත්ත ... | අවුරුදු 40 ක් පරන පොල්වත්තක් ... | කඳානේ උස්වැටකෙයියාවේ ''වික්ටෝරියා විලා''හි විනිප්‍රිඩා හෙන්රිටා රුද්‍රිගු මහත්මිය | 20 2 22 |
| 2 | එම ... | තාවකාලික ලිඳක් සහිත අවුරුදු 40ක් පරණ පොල් වත්තක් සහ කුඹුරක් | එම ... | 18 0 13 |
| 3 | එම ... | පොල් අතු සෙවිලි කළ බදමයෙන් බඳින ලද බිත්ති සහිත තාවකාලික ගෙයකින් යුත් අවුරුදු 40ක් පැරණි පොල් වත්තක් | එම ... | 26 3 04 |
| | | | එකතුව ... | 65 1 39 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 නොවැම්බර් මස 1 වැනි දින පූ.භා. 11ට නාත්තන්ඩියේ ප්‍රා. ආ. නිලධාරි තැනගේ කාර්‍යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958වේ ඔක්තෝම්බර් මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම්දිය යුතුයි.

1958 සැප්තැම්බර් මස 22 වැනි දින,
පුත්තලමේ කච්චේරිය.

ආ. සි. නවරත්නරාජා,
පුත්තලම දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරනු ලබන්නේ **ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරණු නොලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුවම අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරණ දින තුනකට **ප්‍රථම පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | | ... ... | 0 | 25 |
| | | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | | ... ... | 0 | 10 |
| | | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේනම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ, රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ** අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.